## කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

### පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

### බුද්ධ ධර්මය - I

6 ශ්‍රේණිය | කාලය පැය 1 1/2 යි

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) සිදුහත් බෝසතාණන්ට මනුලොව උපදින්නට ආරාධනා කළේ

i. සොත්ථිය බමුණා ය
ii. සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන් ය
iii. මාර දිව්‍ය පුත්‍රයා ය
iv. ඝටීකාර බ්‍රහ්මයා ය

02) සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගත්තේ

i. වෙසක් පෝ දිනය
ii. පොසොන් පෝ දිනය
iii. ඇසළ පෝ දිනය
iv. දුරුතු පෝ දිනය

03) බෝසත් කුමරුට නම් තැබීමේ උළෙල පැවැත්වූයේ කුමරු ඉපදී

i. සත්වන දිනයේ ය
ii. සිව්වන දිනයේ ය
iii. දෙවන දිනයේ ය
iv. පස්වන දිනයේ ය

04) සුද්ධෝදන රජුගේ ගුරුවරයා වූයේ,

i. අසිත තවුසා ය
ii. සර්වමිත්‍ර බමුණා ය
iii. ආලාරකාලාම තවුසා ය
iv. උද්දකරාමපුත්ත තවුසා ය

05) යශෝධරා දේවියගේ පියාණන් වූයේ

i. බිම්බිසාර රජු ය
ii. සුද්ධෝධන රජු ය
iii. සුප්පබුද්ධ රජු ය
iv. අශෝක රජු ය

06) පංචමහා විලෝකනයට අයත් වන්නේ කාලය, දීපය, දේශය, කුලය හා

i. ආගම ය
ii. ප්‍රියා ය
iii. මව ය
iv. පෙළපත ය

07) බෝසත් කුමරුගේ නම් තැබීමේ උළෙලට කැඳ වූ බමුණන් ගණන වන්නේ,

i. 105 කි
ii. 100 කි
iii. 108 කි
iv. 103 කි

The National e-learning Portal for General Education

08) සිදුහත් කුමරු සමඟ එකට හැදුණු කුමරුන් දෙදෙනෙකු වන්නේ

i. නන්ද හා කාළුදායි ය
ii. කාළුදායි හා අස්සජි ය
iii. නන්ද හා ගවම්පති ය
iv. කාළුදායි හා කොණ්ඩඤ්ඤ ය

09) බෝසතාණන් වහන්සේට සිවුරු පිරිකර පූජා කළේ

i. සොත්ථිය බමුණා ය
ii. සර්වමිත්‍ර බමුණා ය
iii. භාරද්වාජ බමුණා ය
iv. ඝටීකාර බමුණා ය

10) ''බුදු බව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි'' බෝසතුන්ට ආරාධනා කළේ,

i. කොසොල් රජු ය
ii. බිම්බිසාර රජු ය
iii. උදේනි රජු ය
iv. අශෝක රජු ය

11) බෝසතාණන් වහන්සේට කිරිපිඬු පූජා කළේ

i. නන්දා සිටුදේවියයි
ii. සුමනා සිටු දේවියයි
iii. විශාඛා සිටු දේවියයි
iv. සුජාතා සිටු දේවියයි

12) ත්‍රිවිධ චෛත්‍ය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න

i. පාරිභෝගික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය, ශාරීරික චෛත්‍ය
ii. උද්දේසික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය, ශාරීරික චෛත්‍ය
iii. ශාරීරික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය
iv. ශාරීරික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය

13) පහත දක්වා ඇති වචන හතර සඳහා භාවිතා කරන ශාසනික වචන අනුපිළිවෙළට දක්වා ඇති වරණය තෝරන්න.

යනවා , නානවා , නිදාගන්නවා , අනුභව කරනවා

i. පැන් පහසු වෙනවා, වඩිනවා, සැතපෙනවා, වළඳනවා
ii. වඩිනවා, පැන් පහසුවෙනවා, සැතපෙනවා, වළඳනවා
iii. වඩිනවා, සැතපෙනවා, වලඳනවා, පැන්පහසුවෙනවා
iv. වළඳනවා, පැන්පහසුවෙනවා, සැතපෙනවා, වඩිනවා

14) නිවැරදි ඉරියව්වක හිඳිමින් සිත එක්තැන් කරගැනීමට හා සියලු සතුන් කෙරෙහි මිතුරු සිත පැතිරවීමට කරනු ලබන භාවනාව.

i. ආනාපානසති භාවනාව නම් වේ
ii. සමථ භාවනාව නම් වේ
iii. විදර්ශනා භාවනාව නම් වේ
iv. මෛත්‍රී භාවනාව නම් වේ

15) මෙත් වැඩීමේ අනුසස් සංඛ්‍යාව වන්නේ

i. 11 කි
ii. 16 කි
iii. 15 කි
iv. 24 කි

16) ''සද්ධාය සම්පදිත්තේන ..........'' යනුවෙන් ආරම්භ වන්නේ,

i. පහන් පූජා කරන ගාථාව යි
ii. පැන් පූජාකරන ගාථාව යි
iii. බෝධි වන්දනා ගාථාව යි
iv. ගිලන්පස පූජා කරන ගාථාව යි

17) ධම්ම රත්නයේ ගුණ සංඛ්‍යාව වන්නේ

i. 9 කි
ii. 24 කි
iii. 10 කි
iv. 6 කි

18) බෞද්ධයෙකු විසින් ගෞරව කරන පිළිවෙළ වන්නේ

i. ගුරුවරු, හිතමිතුරු, මව්පිය , මැදහත් අය
ii. මව්පිය , ගුරුවරු, හිතමිතුරු, මැදහත් අය
iii. මැදහත් අය, මව්පිය , ගුරුවරු, හිතමිතුරු
iv. හිතමිතුරු, ගුරුවරු, මැදිහත් අය, මව්පිය

19) සිදුහත් කුමරු උපත ලැබුවේ

i. ඇසළ පෝ දින ය
ii. නිකිණි පෝ දින ය
iii. වෙසක් පෝ දින ය
iv. බිනර පෝ දින ය

20) බෞද්ධයන් වන අප දිනපතා සමාදන්වන ශීලය වන්නේ

i. පංචශීලය යි
ii. අෂ්ඨමක ශීලය යි
iii. දස ශීලය යි
iv. සාමණේර ශීලය යි

The National e-learning Portal for The General Education

## 2 - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවලට (2 + 3 + 5 = 10) ලකුණු 10 බැගිනි.

01)

i. බුද්ධ කෝලාහලය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. දේවාරාධනාව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද ? (ලකුණු 03)

iii. "අග්ගෝ හමස්මි ලෝකස්ස ....." යනුවෙන් ආරම්භ වන ගාථාවේ තේරුම් ලියා දක්වන්න. (ලකුණු 03)

iv. සිදුහත් කුමරු ජයගත් අභියෝග තුනක් ලියන්න. (ලකුණු 03)

v. "නිබ්බුතා නූන සා මාතා...." යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

vi. පන්සලේදී අනුගමනය කරන වත් පිළිවෙත් 04 ක් ලියන්න. (ලකුණු 04)

02)

i. පංචමහා විලෝකනය හඳුන්වන්න වෙනත් නමක් ලියන්න. (ලකුණු 02)

ii. බෝසත් කුමාරෝත්පත්තිය සමඟ සිදුවූ අසිරිමත් සිදුවීම් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. සිදුහත් කුමරුගේ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න. (ලකුණු 05)

03)

i. වප්මගුල් උත්සවයේ දී සිදුහත් කුමරු වැඩූ භාවනාව නම් කරන්න. (ලකුණු 02)

ii. සිදුහත් කුමරු හැදෑරූ ශිල්ප 03 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. පස්වග මහණුන් නම් කරන්න. (ලකුණු 05)

04)

i. මහාභිනිෂ්ක්‍රමණය යනු කුමක් ද ? (ලකුණු 02)

ii. ත්‍රිවිද්‍යා නම් කරන්න. (ලකුණු 03)

iii. බුදු උපත සැපතකි යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 05)

05)

i. අතුගානවා යන්නට යෙදෙන ශාසනික වචනය ලියන්න. (ලකුණු 02)

ii. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න. (ලකුණු 03)

iii. බෝධි වන්දනා ගාථාව ලියන්න. (ලකුණු 05)

06)

i. භාවනා කිරීම සඳහා හිඳගන්නා ඉරියව් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. මෛත්‍රී භාවනාවේදී මෙත් සිත පතුරවන පිළිවෙළ පෙන්වා දෙන්න. (ලකුණු 03)

iii. මෛත්‍රී භාවනාවේ ආනිසංස පහක් ලියන්න. (ලකුණු 05)

07)

i. රාහුල හාමුදුරුවෝ රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද ? (ලකුණු 02)

ii. රාහුල හාමුදුරුවෝ වැලි දෝතක් උඩ දමා කළ ප්‍රාර්ථනාව කුමක් ද ? (ලකුණු 03)

iii. රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ඔබේ ජීවිතයට ගතහැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

The National e-Learning Portal for The General Education